විදේශ අමාත්‍ය තුමා විසින් ජනවාරි 18, 2012 දින අරිවියල් නගර් 1 හි ( කිලිනොච්චිය) ප්‍රතිසංස්කරණය කරන ලද පාසැල සහ නිමවන ලද නිවාස භාරදීමේ උත්සවයේ දි කරන ලද ප්‍රකාශය

ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යය තුමනි,
ගරු විදේශ අමාත්‍යය ජි එල පීරිස් අමාත්‍යය තුමනි,
ගරු සම්ප්‍රධායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යය තුමනි,
ගරු උතුරු පළාත් ආණ්ඩුකාර තුමනි,
සම්භාවණීය අමුත්තනි,
නෝනාවරුනි මහත්වරුනි,

උතුරු පළාතේ කිලිනොච්චිය, මුලතිවු, සහ වවුනියාව යන දිස්ත්‍රික්ක තුනෙහි පිහිටි යුද්ධය නිසා හානි වු පාසැල් 79 ක් පිලිසකර කිරීමේ ව්‍යාපෘතිය යටතේ පිළිසකර කරන ලද ප්‍රථම පාසැල භාර දිමේ උත්සවය නිමිතිකොට පැවැත්වෙන මෙම උත්සවයට සහභාගීවිමට ලැබිම ඉමහත් සතුටක් ගෙන දෙන්නකි.

මෙම ව්‍යාපෘතිය සකස් කරන ලද්දේ නැවත පදිංචිකරන ලද යුද්ධය නිසා අවතැන් වූ අයගේ දරුවන්ට සිය අධ්‍යාපන කටයුතු ඉක්මනින් නැවත ඇරඹිම පිණිස ආධාර කරිමේ සහ මෙම කලාපයේ අධ්‍යාපනික යටිතල පහසුකම්වලට නව මුහුණුවරක් දිමේ අරමුණ ඇතිවය.

මෙම ස්ථානයට පැමිණීමට කලින් කිලිනොච්චිය මහ රෝහලෙහිදි සෞඛ්‍යාරක්ෂණ ප්‍රමිතිය වැඩි දියුණු කිරීමට බෙහෙවින් වැදගත්වන, එමෙන්ම රෝගින් ගිලන් රථ මගින් යාපනය සහ කොළඹ රෝහල් වෙත යැවිමේ අවශ්‍යයතාව මග හරවන ඉතා වැදගත් වෛද්‍ය උපකරණ රැසක් භාර දුන්නෙමි. එවැනිම උපකරණ

තොගයක් මුලතිව්හි පිහිටි දිස්ත්‍රික්ක රෝහලට ලබා දී ඇත. යුද්ධය අවසානවීමත් සමගම හදිසි වෛද්‍යාධාර සැපයීම සහ කෘතිම් අවයව සවිකිරීමේ කඳවුරු පැවැත්වීම වැනි අනෙකුත් සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයෙහි ව්‍යාපෘති සඳහා අප විසින් අධාර සපයා ඇත. තවද යාපනය ශික්ෂණ රෝහලට වෛද්‍ය උපකරණ ප්‍රධානය කොට ඇත. මෑතකදී ඉන්දිය රජය වව්නියා මහ රෝහලේ ඇඳන් 200 කින් සමන්විත වාට්ටු සංකීරණයක් තැනීමට වූ යෝජනාවකට අනුමැතිය ලබා දුනි.

මෙම පාසැලේ මිදුලට ඔබ්බෙන් පෙනෙන නිවාස 1000 කින් සමන්විත නිවාස සංකීරණය නිමවා ඇත්තේ 2010 වසරේ නොවැම්බර් මස මා මෙහි පැමිණ දියත් කරන ලද නිවාස යෝජනා ක්‍රමයේ නියමු ව්‍යාපෘතියක් ලෙසය. මෙම නිවාස මෙම අරිවියල් නගරයෙහි සිටිනා ප්‍රතිලාභින්ටත්, අද දින පසු අවස්ථාවක යාපනය අරියාලයිහි සිටිනා ප්‍රතිලාභින්ටත් භාර දීමට හැකි වීම ගැන මම සතුටු වෙමි. මෙම නියාමක ව්‍යාපෘතිය මගින් උගත් පාඩම් නිවාස 49,000 සමන්විත වූ මිළඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රයෝජනවත් වන බවට කිසිදු සැකයක් නැත. මෙම ව්‍යාපෘතිය සුමට ලෙස ක්‍රියාවට නංවනු පිණිස වූ අවබෝධතා ගිවිසුමකට පීරිස් ඇමති තුමා සහ මම ඊයේ දින අත්සන් තැබුවෙමු. ශ්‍රී ලංකා රජයේ අඛණ්ඩ සහයෝගය අපි ඉදිරියටත් බලාපොරොත්තු වෙමු.
උතුරේ අවතැන් වූ ජනතාව පුනරුත්ථාපනය, නැවත පදිංචිකිරිම සහ යහපැවැත්ම වෙනුවෙන් ඉන්දියාව පූර්ණ ලෙස කැපවී සිටී. තවත් බොහෝ දේ ඔවුන් වෙනුවෙන් කිරිමට අපි සූදනමින් සිටිමු.

ස්තුතියි.